සැ. යු. - (i) 2026.03.13 දින අංක 2480 දරන රජයේ ගැසට් පත්‍රයේ vi කොටසේ මාර්ගගත ක්‍රමය (online) මගින් පළ වූ කොළඹ දිස්ත්‍රික් ජූරි සභික නාමාවලිය අවලංගු කරන ලදී.
(ii) මෙහි නිවැරදි ජූරි සභික නාමාවලිය 2026.05.08 දින 2488 දරන රජයේ ගැසට් පත්‍රයේ vi කොටසේ පළ විය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,489 - 2026 මැයි මස 15 සිකුරාදා - 2026.05.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )

## II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... | 124 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 125 |

### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජුනි මස 05 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 මැයි මස 22 දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www. documents. gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

123 - B 082792 — - (2026/05)
C 1 -

# පිස්කල් විකිණීම

**මීනුවන්ගොඩ දිසා අධිකරණයේ දී ය**

ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ අංක 59 (1) "ආ" සහ 59 (3) වගන්තිය යටතේ සහ 1983 අංක 32 සහ 1992 අංක 11 දරන පනත්වලින් සංශෝධිත 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 59 (1) (ආ) සහ 59 (3) වගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමයි.

නඩු අංකය : 05
ස්වභාවය : විශේෂ

ගම්පහ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්, වලව්වත්ත, කීඩගම්මුල්ල, ගම්පහ.

*...........පෙත්සම්කරු.*

*එදිරිව*

01. ජයලත් ආරච්චිලගේ රංජනී ජයලත්,
    සීදුව වත්ත, ලිහිණියගම්මන, බඩල්ගම.

02. කේ. ඒ. රංජිත් විජේසිරි,
    රජයේ වත්ත, මරඳගහමුල.

03. මාණික්කුගේ රොනිල් මෝහන් ද සිල්වා,
    සෙන් මේරිස් ජනපදය, බඩල්ගම.

..................වගඋත්තරකරුවෝ.

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් කර ඇති විකිණීමේ ආඥාව අනුව වර්ෂ 2011.03.01 දින මීනුවන්ගොඩ දිසා අධිකරණයෙන් ප්‍රදානය කරනු ලැබූ තීන්දුව ප්‍රකාරව පළමුවන වගඋත්තරකරුගෙන් අයවීමට ඇති රු. 6,24,001/- ක මුදලක් ද එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම වන තෙක් ඒ මත නෛතික පොළිය ද, නඩු ගාස්තු ද, ඇස්කිසි ගාස්තු ද, පිස්කල් ගාස්තු වශයෙන් අනෙකුත් ගාස්තු ද අයකර ගැනීමට එකී පළමුවන වගඋත්තරකරුට අයත් මීනුවන්ගොඩ දිසා අධිකරණය විසින් තහනමට ගෙන ඇති මෙහි පහත උපලේඛනයේ සඳහන් දේපලෙහි සියළුම අයිතිවාසිකම් හා හිමිකම්,

**වර්ෂ 2026 ක් වූ ජූනි මස 01 දින ප. ව. 2.30ට**

දේපල පිහිටි බඩල්ගම යන ගමෙහි දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට යෙදෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයට අයත් අලුත්කුරු කෝරළේ දූනාගහ පත්තුවේ, බඩල්ගම පිහිටි "හල්ගහවත්ත" නමැති ඉඩමෙන් බෙදා වෙන් කරන ලද ලොට් 01 දරන බිම් කොටසට 2006.12.21 දින එස්. සෙනරත් මානක තැන විසින් මැන සෑදූ අංක 2958 දරන සැලැස්ම ප්‍රකාර,

උතුරට : පාර ද,
නැගෙනහිරට : සුදේශිකා කන්නන්ගර හිමිකම් කියන ඉඩම සහ පී. රුවන් මාලා සහ තවත් අය හිමිකම් කියන අත්හල කුඹුර ද,
දකුණට : පී. රුවන් මාලා සහ තවත් අය හිමිකම් කියන අත්හල කුඹුර සහ රජය සතු ඉඩම ද,
බස්නාහිරට : පිඹුරු අංක 2933 හි කැබලි අංක 01 දරන කොටස ද,

මායිම් වූ අක්කර දෙකයි රූඩ් එකයි පර්චස් විසි හයයි දශම පහ (අ. 02, රූ. 01, පර්. 26.5) විශාල ඉඩම් කොටස සහ ඒ තුළ පිහිටි සෑම සියලු දේත් වේ.
(පෙර ලියාපදිංචිය ඊ. 1005/116 මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී ඇත.)

*ඉඩමට පිවිසීම :*

මීනුවන්ගොඩ සිට 268 බඩල්ගම - මීනුවන්ගොඩ බස් මාර්ගයේ බඩල්ගම දක්වා පැමිණ බඩල්ගම හංදියෙන් මීගමුව දෙසට මීටර් 200 පමණ පැමිණෙන විට හමුවන වාහන සර්විස් එක ( කේ. ඒ. සිරිසේන ක්‍රීඩාංගනය ඉදිරිපිට) ලඟින් වමට පාරේ මී. 150 පමණ ඉදිරියට එනවිට වම් පස අදාළ ඉඩම පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය :*

වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය. චෙක්පත් බාරගනු නොලැබේ.

01. ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් සියයට විසිපහක් (25%),
02. නොතාරිස් ගාස්තු සහ ගමන් ගාස්තු,
03. සියලුම ප්‍රචාරක වියදම්,
04. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු (2.5%)
05. රජයේ ගාස්තු හෝ පළාත් පාලන ආයතන ගාස්තු 1%,
06. ලිපිකරු, බෙරකරු හෝ සෝෂක ගාස්තු,
07. ගැණුම් මිලෙන් 75% ක මුදල දින 30ක් ඇතුළත දී මීනුවන්ගොඩ දිසා අධිකරණයේ අංක 05/විශේෂ නඩුවට තැන්පත් කළ යුතු ය.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය - මීනුවන්ගොඩ.

*විස්තර සඳහා විමසීම් :*

බැංකු සේවා කළමනාකරු,
සී/ස කෙහෙල්ඇල්ල වි.සේ.ස. සමිතිය,
බඩල්ගම.
දු.ක. 031 - 4939311

05-102

---

# විවිධ දැන්වීම්

## පාර්ලිමේන්තුව

"ජාත්‍යන්තර පාරම්පරික සිංහලවෙදය සභාව (ITSC) සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි"

ඩබ්. එච්. එම්. ධර්මසේන වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල 53 දරන ස්ථාවර නියෝගය යටතේ "ජාත්‍යන්තර පාරම්පරික සිංහලවෙදය සභාව (ITSC) සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි" යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ මතු සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී "ජාත්‍යන්තර පාරම්පරික සිංහලවෙදය (ITSC) " සංස්ථාගත කිරීමයි :-

(අ). ජාත්‍යන්තර පාරම්පරික සිංහලවෙදය ආයතනය (ITSI) නමින් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ස්ථාපිත කිරීම ;

(ආ) පාරම්පරික සිංහල වෙදකම, සිංහල හෙදකම, සිංහල ගොවිතැන, සිංහල සටන් කලාව, සිංහල ජ්‍යොතිර්වේදය, සිංහල භූත වෛද්‍ය විද්‍යාව සහ සිංහල නර්තනය, සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයම නියෝජනය කරන සාමාජිකයන් ලවා ප්‍රවර්ධනය කිරීම ; සහ

(ඇ) සුවතා පරිසර හිතකාමී සංචාරක ව්‍යාපාරයන්ට (Wellness Eco-tourism) සහායවීමෙන් ජාත්‍යන්තර සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම මගින් සංචාරකයන්ගේ මානසික කායික සුවතාවය ලබාගැනීමට සහායවීමෙන් ශ්‍රී ලංකාවට විදේශ විනිමය ලබාගැනීමට ක්‍රියාකිරීම ;

යනාදිය වේ.

ඩබ්. එච්. එම්. ධර්මසේන,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

05 - 187

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.